

# කදිරගාමර්

## සදානුස්මරණීය නායකයා

**අනුර හොරේෂස්**

**අලු** යට සැඟවී තිබෙන ගින්දර නොපෙනෙන්නේ යයි පැරැණි කියමනකි. මෙතුලිටින් පෙනෙන්නට ඇත්තේ අලු වලින් වැසුණු යායකි. එය ඉතා තැන්පත් ය. සන්සුන් ය. නිසොල්මන් ය. දැවිනත භීෂණයක්, විනාශයක් ගෙ දිය හැකි මහා ගිණි ජාලාවක් ගුප්ත ආකාරයෙන් නිහඬව තිබීම විශ්මයකි. නමුත් එකී විශ්සය එක පැහැර අහෝසි වී ගොස් රකුසකු බඳු ගිනි ජාලාව බුර බුරා අහසට නැඟෙන්නට ගත වන්නේ ඇසිල්ලකි. චණ්ඩ මාරුතයකින් නොව ගත සිත සනසනවා යැයි අපට සිතෙන සිහින් සුළං රැල්ලකින් වුවද අලු යාය ඈතට ගසාගෙන ගොස් භීෂණයේ විනාශයේ රුදුරු ගිනිජාලාව වේගයෙන් අවට පැතිරී යා හැකි ය. ඊට අසුවන සියල්ලන්ම නිමේෂයෙන් ගිනි ගෙන දැවී අලු වී යන්නට පිළිවන.

අලු යට තිබෙන ගිනි පෙනෙන්නේ නැතැ යි පැරැන්නෝ පැවසුවේ ඒ නිසා ය. එකි කියමන අද ශ්‍රී ලංකාවට මනා ලෙස ගැලපෙමින් තිබෙන්නේ ආයිත්තමකට එල්ලන අරුමෝසම් මෙන් විවිධ හැඩැති අපරාධ, කෙනෙහිලි, දූෂණ, අක්‍රමිකතා, ජාතිවාදී, ත්‍රස්තවාදී ආදී මෙකී නොකී සියලුම දුෂ්ඨ ක්‍රියාවන් සියල්ලක්ම පෙර පැවසූ ආකාරයට සුළඟක් සේ රම්‍ය දිවයින පුරා හමන්නට පටන් ගෙන ඇති බැවින් ය. එහෙත් තවමත් ගිනි මතුපිට තිබෙන අලු යාය සන්සුන් ය. නිසොල්මන් ය. තැන්පත්




ය. මෙම අලුයාය කළඹා ගිනි ජාලාව මතුකැර ගන්නට ක්ෂණික වෙඩි පහරක් නොබෝදා එල්ල විය. ඒ ලක්ෂ්මන් කදිරගාමර් ඇමැතිවරයාගේ පපුවට ය.

ඔහුගේ පපුවට ශ්‍රී ලාංකීය ජනතාව ජාති ආගම් බේදයකින් තොරව ආදරයක් ගෞරවයක් දක්වන බව එල්ටීටීඊය දැන සිටියේ ය. ලක්ෂ්මන් කදිරගාමර් යනු ජනතාවගේ පූජනීය වස්තුවක් බව කොටි ත්‍රස්තවාදියා දන්නේ ය. එදා මෙදා තුර ශ්‍රී ලංකාවේ පහළ වූ ශිෂ්ඨ ඇමැතිවරුන් අල්පයක් අතරේ කදිරගාමර් මහතාට හිමි වූයේ ඉහළම ස්ථානයකි. කොටි ත්‍රස්තවාදීන් විසින් ජාත්‍යන්තරව ගෙන යන ශ්‍රී ලංකාව අපකීර්තියක් ගෙන දෙන අසත්‍ය ප්‍රචාර කණපිට ගසා යතාර්ථය ලෝක බලවතුන්ගේ පපු වලට ඇතුළු කොට

ඔවුන්ගේ ඉහ මොළ රත් කැරවූ විශිෂ්ඨතම කීර්තිමත් විදේශ අමාත්‍යවරයා වූයේ කදිරගාමර් මහතා ය. එවැන්නකු මරා දමා කොටි ත්‍රස්තවාදියා නැවතත් උරගා බැලුවේ දෙමල ජනතාවට එරෙහිව සිංහලයාගේ ප්‍රචණ්ඩත්වය මතු කොට භීෂණයේ මහා ගිනි ජාලාව අවුළුවන්නට ය. හදවත් වාවාගත නොහැකි වුව ද ප්‍රචණ්ඩත්වයට යොමු නොවී කඳුලින් සුසුම්න් දුක වේදනාව සමනය කැර ගනිමින් කදිරගාමර් මහතාට සමුදෙන්නට තරම් ජනතාව ඉවසීම මුළු මහත් ජාතියේ ම වාසනාවකි.

නමුත් ප්‍රශ්නයක් තිබේ. කොටි ත්‍රස්තවාදීන්ගේ මෙම ඝාතන රැල්ලේ අවසානයක් අපට දක්නට ලැබෙන්නේ කවදාද? යන්න එම ප්‍රශ්නයයි. කදිරගාමර් මහතා කොටි ගිනි අවියේ අවසාන ඉලක්කය නොවේ. මුල්ම ඉලක්කයද නොවේ.

ගත වූ කාලය දෙස ආපසු හැරී බලද්දී රටේ නායකත්වයට උරුම කම් කිව හැකි, උරුම කියූ දේශපාලන නායකයන් බොහෝ දෙනෙක් කොටි ත්‍රස්තවාදීන් විසින් බිලි ගත්තේ ය. ඊට අමතරව ජාති බේදයක් නැතිව දේශපාලන පක්ෂ නායකයන් මරා දැම්මේ ය. රටේ දේශපාලන නායකයන් මරා දැමීම යනු රට අරාජික කිරීමකි. දේශපාලන පක්ෂ නායකයන් මරා දැමීම පක්ෂ වඳ කිරීමකි. නැතිනම් බෙලහීන කිරීමකි. ඒ සියල්ලකින්ම කොටි සංවිධානය බලාපොරොත්තු වූයේ අරාජික රටක් තුළ ගිනි අවියෙන් සහ ත්‍රස්තවාදයෙන් සිය අසීමිත අභිප්‍රායන් සපුරා ගන්නට ය.
එකී අරමුණ කරා කොටි සංවිධානය නොනැවතී ගමන් කරමින් සිටීත කදිරගාමර් මහතා ඝාතනය කොටි ත්‍රස්තයන් ලැබූ සුවිශාල ජාත්‍යන්තර ජයග්‍රහණයකි. දෙමල ජනයා අතරින් බිහිවූ කදිරගාමර් මහතා දෙමල ජනයා අතරින් ම බිහිවූ කොටි සංවිධානයට එරෙහිව විචක්ෂණ හා තීක්ෂණ ලෙසත් ජාත්‍යන්තර ප්‍රජාව, ලෝක බලවතුන් දැනුවත් කලේ ය. කොටි සංවිධානයට එරෙහිව මෙතරම් බුද්ධිමත් හා ඉවසිලිමත් ලෙස කටයුතු කළ වෙනත් විදේශ අමාත්‍යවරයෙක් ශ්‍රී ලංකාවේ එදා මෙදා තුර බිහි නොවුණේ ය. කදිරගාමර් මහතා ඝාතනයත් සමඟ ඒ හිඩැස පුරවන්නට තවත් සුදුස්සෙක් ශ්‍රී ලංකා දේශපාලන භූමිකාවේ නැති තරම් ය.
කොටින්ගේ ඉදිරි ඝාතන ලැයිස්තුවේ ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ, ජවිපෙ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ, එම පක්ෂයේ ලේකම් ටිල්වින් සිල්වා යන මහත්ම මහත්මීන් ඉදිරියෙන්ම සිටින බව ප්‍රකට කරුණකි. ඉතින්.. කොයි මොහොතක හෝ මොවුන් එල්ටීටීඊ යේ ඉලක්කයක් වනවාට කිසිදු සැකයක් නැත. එසේ දැන දැනත් කොටි ත්‍රස්තවාදීන්ගේ මෙම ඝාතන ත්‍රස්තවාදී සංස්කෘතිය ඉදිරියේ මුළු මහත් ශ්‍රී ලංකා වාසී ජනතාවට සුසුම් හෙළමින් පසුවන්නට සිදුවීම මොන තරම් අභාග්‍යයක්ද?



ආරක්ෂාව

# සටන් විරාමය අර්බුදයට

**තිස්ස රවීන්ද්‍ර පෙරේරා**

ශ්‍රී ලංකාවේ පවතින ජනවාර්ගික අර්බුදයට සාකච්ඡාමය විසඳුමක් සෙවීමට බව කියමින් පසුගිය එ.ජා.ප. රජය හා කොටි සංවිධානය අතර සටන් නවතාලීමේ ගිවිසුමක් අත්සන් තැබුවේ මීට මාස හතළිස් තුනකට පෙරය.
වෙනත් විදියහිකින් කිවහොත් 2002 වසරේ පෙබරවාරි 22 වැනිදාය.

මෙම ගිවිසුම අනුව කිසිම පාර්ශ්වයකට යුද හමුදා මෙහෙයුමක නිරත විය නොහැකිය. සටන් නවතාලීමේ ගිවිසුමේ 1.2 වගන්තියේ ,අ,ජේදයේ මෙය සඳහන්ය. එහි ,ආ, ජේදයට අනුව ආයුධ මගින් ඍජුව හෝ වක්‍රාකාරයෙන් වෙඩි තැබීම් ආයුධ සන්නද්ධ වැටලීම්, රහසින් රැක සිට පහරදීම්, ප්‍රභූ ඝාතන, පැහැරගෙන යෑම්, හමුදාවේ හෝ සාමාන්‍ය වැසියන්ගේ දේපළ හානි කිරිම්, සියදිවි නසා ගන්නා මෙහෙයුම් සහ ගැඹුරු ප්‍රවේශ ඒකකයන්ගේ ක්‍රියාවන් නවතා ලිය යුතුය.

මේ ආකාරයට සාම ගිවිසුමක් හරහා රජයේ හමුදාවන්හි අතපය බැඳ දැමූ කොටි සංවිධානය මේ වන විට සංවිධානයක් වශයෙන් සන්නද්ධ බලය තර කරගෙන හමාරය.

ඔවුන්ට එරෙහිව ජාත්‍යන්තර හඬක් නැගූ විදේශ කටයුතු ඇමැති ලක්ෂ්මන් කදිරගාමර් මහතාව මෙම අගොස්තු මස 12 වැනිදා ඝාතනය කලේ රටපුරා භීතියක් ඇති කරමිනි. ජාතික ආරක්ෂක මණ්ඩලයේද නිත්‍ය සාමාජිකයකු වූ ලක්ෂ්මන් කදිරගාමර් මහතාව කොළඹ අධි ආරක්ෂිත කලාපය අසලම වූ බුලර්ස් පටුමගේ පිහිටි නිවසේදී ඉලක්ක වෙඩි ප්‍රහාරයකින් ඝාතනය කළේ කොළඹදී රටේ ජනාධිපති වුවද ඝාතනය කළ හැකි බව පෙන්වා දෙමිනි.
යුද හමුදා කමාන්ඩෝ බලකා මේජර්වරුන් දෙදෙනකු හා සෙබලුන් හතළිහක්ද සමග ප්‍රභූ ආරක්ෂකයන් 150 කගේ ආරක්ෂාව සපයා දී තිබියදීත් සූක්ෂම ලෙස කදිරගාමර් මහතාව ඝාතනය කළේ ශ්‍රී ලංකා රජයට තිබූ ජාත්‍යන්තර බලවේගයද බිඳ දමමිනි.
කොටි ක්‍රියාකාරකම්වලට එරෙහිව ප්‍රසිද්ධියේම කතා කරමින් කොටින්ට සුනාමි සහන මණ්ඩලයක් (P - Toms) ලබාදීමට පවා විරුද්ධ වූයේ කදිරගාමර් මහතාය. අයර්ලන්ත අයි. ආර්. ඒ. ගරිල්ලන්ට අවි බිම තැබීමට හැකි වූයේ නම් එල්.ටී.ටී.ඊ.ය ද අවි බිම තැබිය යුතු බව දැඩි මතයක් ඇති කිරිම මෙතරම් ඉක්මනින් කොටින්ගේ ඉලක්කය කට යාමටද හේතු විය.

මෙම ඝාතනය හරහා කොටින්ට අන්තර්ජාතික වශයෙන් බලපෑම් එල්ල වීමට පටන් ගැනීමත් සමග එය මකා ගැනීම සඳහා යළි සාකච්ඡා සඳහා පැමිනිමට කොටි සංවිධානය එකගතාවය පළ කළ සිටියේය.
ශ්‍රී ලංකා රජය සමග ඍජුව සාකච්ඡා පැවැත්වීමට එකග බව රජයට දැනුම් දුන්නේය.

රජයේ පාලන ප්‍රදේශවල සිටින රජයේ හමුදා නිරායුධ කරන තෙක් සාකච්ඡා මේසයට නොඑන බව දන්වා 2003 වසරේ සිට රජය සමග ඍජු සාකච්ඡාවලට නොපැමිනි කොටි සංවිධානය කදිරගාමර් මහතාගේ ඝාතනයක් සමග ඒ සියලූ ප්‍රශ්න අතහැර දැමුවේ සියලූදෙනා යළිත් වතාවක් ගොනාට අන්දවමිනි.

> අගමැති මහින්ද රාජපක්‍ෂ මහතා ජනාධිපතිධුරයට පත්වුවහොත් තමන්ට අවශ්‍ය කාර්යයන් ඉටු නොවන බව දන්නා කොටි සංවිධානය ජනාධිපතිවරණයට පෙර මහින්ද රාජපක්‍ෂ මහතා ඝාතනය කිරීමට අර අදින බවට බුද්ධි අංශ අනතුරු අඟවා ඇත.

26 වන පිටට